කවරයේ කතාව



# තේ කර්මාන්තය සඳහා පර්යේෂණ අංශයේ දායකත්වය

තේ පර්යේෂණ ආයතනයේ උපදෙස් හා ව්‍යාප්ති අංශයේ
**බී.ඒ.ඩී. සමන්සිරි**

**අරාබි ජාතිකයන් ලංකාවේ කුළුබඩු වෙළෙඳමට අවතීර්ණ වීම මත ශ්‍රී ලංකාවේ කෘෂි අපනයන ක්ෂේත්‍රයේ අඩිතාලම ගොඩ නැගුනි. ඉන් අනතුරුව ලංකාව ආක්‍රමණය කළ පෘතුගීසි ලන්දේසි, ජාතිකයන් සහ විශේෂයෙන් බ්‍රිතාන්‍ය ජාතිකයන් ලංකාවේ වැවිලි භෝග කේෂ්ත්‍රය ගොඩ නැගීම උදෙසා විවිධ ප්‍රමාණවලින් දායක විය.**

ලංකාව මහා බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් වීමත් සමගම ලංකාවේ වැවිලි බෝග ක්ෂේත්‍රයට බ්‍රිතාන්‍ය ජාතිකයන් අවතීර්ණ වීම සිදු විය.

මුල් වකවානුවේ බ්‍රිතාන්‍ය ජාතික වැවිලිකරුවන්, ලංකාවේ මධ්‍ය කඳුකරයේ සහ පහතරට සමහර ප්‍රදේශවල කෝපි වගාව විශාල පරිමාණයෙන් කරගෙන යනු ලැබීය. සාර්ථක වැවිලි බෝගයක් ලෙස පවත්වාගෙන ආ කෝපි වගාවේ පරිහානිය ඇරඹුනේ හෙමිලියා වෙස්ටාට්‍රික්ස් (Hemelia vestatrix) නැමති දිලීරයෙන් ඇති වූ රතු මළකඩ රෝගය (Red rust disease) කෝපි වගාවන්ට ආසාදනය වීමත් සමග ය.

එලෙස අභාවයට පත් වූ කෝපි වගාවේ සොහොන් බිම මතින් තේ වගාව උපත ලැබීය. 1867 වර්ෂයේ හේවාහැට ලූල්කඳුර වතුයායේ අක්කර 19 ක තේ වත්තකින් ඇරඹුණ ලංකා තේ කර්මාන්තයේ පීතෘත්වය ස්කොට්ලන්ත ජාතික ජේම්ස් ටේලර් නම් වැවිලි කරුවාට හිමි වේ.

දිලීර රෝගයක් වැළඳීම නිසා කෝපි වගාවට සිදුවූ හානීන් ගෙන් අමිහිරි අත්දැකීම් ලත් වැවිලිකරුවෝ තේ වගාවන්ට ඉදිරියේ දී ඇති වීමට ඉඩකඩ ඇති එවැනි ආපදවලින් ගලවා ගැනීම සඳහා ගතයුතු පියවර පිළිබඳ වඩාත් සැලකිලිමත් වූවෝය. ඒ අනුව ලංකා වැවිලිකරුවන් ගේ සංගමය කළ ඉල්ලීමක් මත 1925 දී ව්‍යවස්ථාපිත සභාවක් මගින් තේ පර්යේෂණ ආයතනය ස්ථාපනය කරනු ලැබීය. මුලින්ම තේ පර්යේෂණායතනයේ කටයුතු 1925 වසරේ දී මහනුවර වික්ටෝරියා ස්වර්ණ ගොඩනැගිල්ලේ ලංකා වැවිලිකරුවන් ගේ සංගමයේ කාර්යාලය තුළ ආරම්භ කර ඉන් පසු 1926 වසරේ දී නුවරඑළිය ලින්ඩ්ස් ෆීල්ඩ් වත්තේ ගොඩනැගිල්ලක මුල් ම තේ පර්යේෂණ විද්‍යාගාරය පිහිටුවනු ලැබීය. ඉන් පසු 1928 වසරේ දී තලවාකැලේ ලිඳුල ප්‍රදේශයට ආසන්න වතුයායක් මිල දී ගත් තේ පර්යේෂණ මණ්ඩලය එහි තේ පර්යේෂණායතනය පිහිටුවී ය. එම කටයුත්තට මූලිකත්වය ගෙන කටයුතු කළ, තේ පර්යේෂණ මණ්ඩලයේ මුල්ම සභාපතිවරයා වූ කුම්බ්ස් මහතාට ගරුකිරීමක් වශයෙන් එම වත්ත ශාන්ත කුම්බ්ස් වතුයාය ලෙස නම් කරනු ලැබීය.

මූලික පර්යේෂණාගාරයේ ගොඩ නැගීම් කටයුතු 1930 අවසන් කිරීමත් සමගම තේ පර්යේෂණායතනයේ පර්යේෂණ කටයුතු ශාන්ත කුම්බ්ස් වතුයායේ පර්යේෂණාගාරයේ දී ආරම්භ විය.

විද්‍යාත්මක පර්යේෂණ මගින් කුඩා තේ වතු හිමියන් ගේ සහ වැවිලිකරුවන් ගේ තේ නිෂ්පාදනය ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව ඉහළ නැංවීම තේ පර්යේෂණායතනය පිහිටුවීමේ මූලික පරමාර්ථයයි. මේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ආයතනය මගින් සැලසුම් කර ඇති දිගුකාලීන සහ කෙටිකාලීන පර්යේෂණ ව්‍යාපෘති මගින් තේ නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව දියුණු කිරීමට, මානව සම්පත් කළමනාකරණ ඵලදායි ලෙස යොදා ගැනීම තුළින් සමස්ථ තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට සහ අප ගේ තේ ක්ෂේත්‍රයේ නියැළී සිටින්නන් ගේ මානව සම්පත් සංවර්ධනයට අවශ්‍ය තාක්ෂණික උපදෙස් සැපයීම සහ නිර්දේශයන් ඉදිරිපත් කිරීම කරනු ලබයි.

දැනට තේ පර්යේෂණායතනයේ තාක්ෂණ අංශයේ විද්‍යාඥයන් සහ අනෙකුත් තාක්ෂණික නිලධාරීන් 107 ක් පමණ සිටී. මෙයට අමතරව තවත් 118 ක් පමණ සංඛ්‍යාවක් පරිපාලන සහ උපකාර අංශවල සේවයේ යෙදී සිටියි.

තේ පර්යේෂණායතනය පිහිටු වූ කාලය වන විට මැදරට, උඩරට සහ ඌව ප්‍රදේශවලත් පහතරට ප්‍රදේශ කිහිපයකත් තේ වගාව පැතිර ගොස් තිබුණි. 1882 දී පමණ විලියම් ජැක්සන් නැමති වැවිලිකරුවා විසින් තේ ගස් කප්පාදු කිරීම සඳහා විධිමත් ක්‍රම වේදයක් හඳුන්වා දෙනු ලැබීය.

1890 දී මුලින්ම "සජීවී තේ කඳන් වේයා" ගෙන් සිදුවන හානිය හඳුනාගත් අතර 1895 වසරේ දී ක්‍රෙග්හෙඩ් වතුයායෙන් ක්ෂයිලොබෝරස් ෆෝනිකේටස් නොහොත් "තේ ගුල්ලා" ගෙන් තේ ගසට සිදුවන හානිය හඳුනා ගනු ලැබීය. මෙම වකවානුව වන විට "හෝමෝනා කොෆිරියා" නොහොත් ටී "ටෝට්‍රික්ස් දළඹුවා" ගෙන් තේ පත්‍රවලට සිදුවන හානිය හඳුනාගෙන තිබූ අතර එම පලිබෝධකයා මර්දනය කිරීම සඳහා පර්යේෂණ වැඩ පිළිවෙළක් දියත් කර තිබුණි. එම පර්යේෂණ කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන්, 1935 දී ජාවා දූපතෙන් ගෙන්වා ගත් "මැක්‍රො සෙන්ටස් හෝමෝනියේ" නැමති කෘමියා මගින් ටී ටෝට්‍රික්ස් දළඹුවා පාලනය කිරීම සඳහා සාර්ථක ජීව විද්‍යාත්මක මර්දන ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය.

ලංකාවේ තේ වගාව ආරම්භ කළ 1867 පමණ සිට තේ වගාවේ රෝපණ ද්‍රව්‍ය ලෙස භාවිත කරනු ලැබුවේ තේ බීජය. 1938 පමණ සිට ශාක ප්‍රචාරක කටයුතු සම්බන්ධව කටයුතු කළ විද්‍යාඥයා සහ එවකට අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ ආචාර්ය ටබ්ස් මහතා, වර්ධක ප්‍රචාරන ක්‍රම මගින් තේ වගා කිරීම පිළිබඳ අධ්‍යයනය කළේය.

තේ වගාවේ හමුවී ඇති එකම වෛරස් රෝගය වන ප්ලෝයම කුණු වීමේ රෝග කාරකය හඳුනා ගැනීම 1939 දී සිදු කරන ලද අතර තේ කඳ ගුල්ලා ගේ ජීවන චක්‍රය පිළිබඳ තොරතුරු රැසක් 1941 වන විට සොයා ගැනීමට හැකි විය.

රතුමලකඩ රෝගයෙන් බැට කෑ කෝපි වගා කරුවන් තේ වගාව ඇරඹීමෙන් පසු තේ පිළිබඳ පර්යේෂණ කිරීමට වගකිව යුතු ආයතනයක් පිහිටුවීමට ගත් තීරණයේ නිවැරදි බව සනාථ කරමින්, පාලනය නොකළ

ලංකාවේ තේ වගාව ආරම්භ කළ 1867 පමණ සිට තේ වගාවේ රෝපණ ද්‍රව්‍ය ලෙස භාවිත කරනු ලැබුවේ තේ බීජය. 1938 පමණ සිට ශාක ප්‍රචාරක කටයුතු සම්බන්ධව කටයුතු කළ විද්‍යාඥයා සහ එවකට අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ ආචාර්ය ටබ්ස් මහතා, වර්ධක ප්‍රචාරන ක්‍රම මගින් තේ වගා කිරීම පිළිබඳ අධ්‍යයනය කළේය.

හොත් තේ වගාවට අද දිනයේදීත් ප්‍රබල ආර්ථික හානියක් සිදු කළ හැකි තේ බුබුලු රෝගය (Blister Blight) 1946 දී මුල්වරට දෙලොස්බාගේ ප්‍රදේශයේ වතු යායකින් හඳුනා ගනු ලැබීය. මෙම රෝගය පාලනය කිරීම සඳහා කැපවුණු විද්‍යාඥයන් රැසක ගේ අප්‍රතිහත ධෛර්යයෙන් 1951 වන විට මෙම රෝගයේ රෝග කාරකය වන එක්සොබැසිඩීම් වෙක්සාන් දිලීරය පිළිබඳ තොරතුරු රැසක් සොයා ගැනීමට හැකිවූ අතර කොපර්, නිකල් ආදිය අඩංගු දිලීර නාශක මගින් මෙම දිලීරය සාර්ථකව වළක්වා ගත හැකි බව හඳුන්වා දීමට හැකි විය.

1950 දශකයේ TRI 2000 කාණ්ඩයේ තේ ප්‍රභේද හඳුන්වා දීමත් 1958 වසරේදී තේ ඉඩම් පුනරුත්ථාපනය කිරීම සඳහා රජය මගින් නැවත තේ වගා කිරීම් වැඩ සටහන හඳුන්වා දීමත් සමගම 1950 දශකයේ මුලු නිෂ්පාදනය වූ තේ මෙ.ටොන් 143,432 ප්‍රමාණය 1960 දශකයේ දී මෙ.ටොන් 197, 180 බවට පත් විය

1950 දශකය අග භාගයේ දී සහ 1960 දශකයේ මුල් වකවානුවේ දී මැග්නීසියම්, නයිට්‍රජන් සහ සින්ක් පෝෂක ඌනතා ලක්ෂණ විස්තරාත්මකව හඳුනා ගැනීමටත් එම තත්ත්වයන් වළක්වා ගන්නා ආකාරය පිළිබඳ වැවිලිකරුවන් දැනුවත් කිරීමටත් තේ පර්යේෂණායතන විද්‍යාඥයන්ට හැකි විය.

## තේ වගාව

හෙක්ටයාර 1,87,000 ක් හෙවත් අක්කර 444,780 ට වඩා මදක් වැඩි භූමි ප්‍රමාණයක තේ වගාව සිදුකොට ඇති අතර වාර්ෂික කළු තේ නිෂ්පාදනය කිලෝ මිලියන 300 ක් පමණ වෙයි.

තේ පඳුර සත්‍ය වශයෙන්ම ගසක් වන අතර නිරන්තරයෙන් සිදු කරන කප්පාදුව මගින් එය මිට්ට හා මතුපිට පෘෂ්ටය වැඩිවන අයුරින් තබාගනු ලබන්නේ අතින් සිදු කෙරෙන දලු නෙලීම කාර්යක්ෂම කිරීමට වඩා යෝග්‍ය වන හෙයිනි. සාමාන්‍යයෙන් පහතරට තේ කප්පාදුව සෑම මාස 18 – 24 අතර වරක් ද මැදරට තේ වසර 3 කට වරක් හා උඩරට තේ කප්පාදුව වසර 4 කට 5 කට වරක් ද සිදු කරයි.

තේ බීජ මගින් ලබා ගන්නා තේ පැළ කඳු බෑවුම්වල පේළි වශයෙන් සිටුවීම මුලදී සිදුවිය. කෘෂිකාර්මික තාක්ෂණයේ දියුණුවත් සමගම එම ක්‍රමය ඉවත්ව වර්ධක ප්‍රචාරක ක්‍රමය ප්‍රචලිත වූ අතර එමගින් මවු ශාකය හා සමාන හොඳ නිෂ්පාදනයක් ලැබීමට අවශ්‍ය තත්ත්වයන් ඇති, වඩා හොඳ ඵලදාවක් මෙන්ම වඩාත් හොඳින් රෝගවලට හා වියළි කාලගුණ තත්ත්වයන්ට ඔරොත්තුදෙනසුළු ගති ලක්ෂණවලින්යුතු පැළ ලබා ගත හැකි විය.

වර්ධක ප්‍රචාරණය හඳුන්වාදීමත් සමග ස්වාභාවික ගති ලක්ෂණයන්ගෙන් යුත් පැළ විශාල සංඛ්‍යාවක්, වැඩි භූමි ප්‍රමාණයක වගා කිරීමට හැකිවීමෙන් ජල සංරක්ෂණය හා පස සෝදාපාළුව අවම කර ගැනීමට හැකි වී තිබේ.

සාමාන්‍යයෙන් තේ රෝපණය කරනුයේ තේ පැළ 2 ක් අතර පරතරය අඩි 2 ක් හා තේ පැළ පේළි 2 ක් අතර පරතරය අඩි 4 ක් වන ලෙසිනි. මේ අනුව එක හෙක්ටයාරයක පැළ 13,000 ක් පමණ වෙයි.

වර්ධක ප්‍රචාරක පැළ වසර 3-4 ක කාලයක දී පරිණත වෙයි. එම කාලය පහතරට තේ පැළ සඳහා කෙටි වන අතර උඩරට තේ සඳහා දීර්ඝ වෙයි.

තේ වගාව දැඩි අවධානයක් යොමු කරමින් කළ යුත්තකි. අනවශ්‍ය පැළ ඉවත් කිරීම, වල් පැළ නෙලීම, ජලය බැසයන කානු පද්ධති පිරිසිදු කිරීම එමගින් වැසි වතුර සංරක්ෂණය හා පස සෝද යෑම වැළකීම, වාර්ෂික කාල සටහනකට අනුව පැළ කප්පාදුව, දුර්වල මැරුණු පඳුරු වෙනුවට අලුත් පැළ සිටුවීම මගින් වගාවේ ගහණය ඉහළ මට්ටමක පවත්වා ගැනීම, පැළයක සිට පරිණත පඳුරක් වීම දක්වාම තුන්හතර වතාවකදී NPK සහිත පොහොර යෙදීම මගින් තේ පදුර හොඳ පෝෂණ තත්ත්වයක පවත්වා ගැනීම, කෘමිනාශක හා දිලීර නාශක යෙදීම මගින් කෘමින්ගෙන් හා රෝගවලින් වළක්වා ගැනීම, මායිම් පවත්වාගෙන යාම (Ravine - කඳුර/පටු ගැඹුරු පැල්ම) හා අනෙකුත් හොඳ කෘෂිකාර්මික ක්‍රම මගින් තේ හොඳ තත්ත්වයේ පවත්වාගෙන යාම සිදු කරයි. උසස් තත්ත්තවයේ තේ නිෂ්පාදනයක් සඳහා සත්‍ය වශයෙන්ම වඩාත් අවධානය යොමු කළ යුතු ක්‍රියාව වන්නේ දළු නෙලීමේ කාර්යයයි. මෙම මුළු ක්‍රියාවලිය සඳහා අවම වශයෙන් එක් හෙක්ටයාරයක් සඳහා කම්කරුවන් දෙදෙනකුවත් තේ කර්මාන්තයට අවශ්‍ය වෙයි. අවසන් නිෂ්පාදනය වන කළු තේ නිෂ්පාදනය කරනු ලබන්නේ තේ දල්ලේ ඉහළින්ම ඇති ළපටි පත්‍ර මගිනි. සාමාන්‍යයෙන් එය පත්‍ර දෙකක් හා පොහොට්ටුව වන අතර එම දළුව නෙලීමේ වඩාත් සුවිශේෂී වූ ක්‍රියාව සිදු කරනු ලබන්නේ අතිනි. හැසිරවීමේ දී හා ප්‍රවාහනයේ දී සිදු විය හැකි පළුදු වීම් ඉතා අඩු මට්ටමකින් තබා ගනිමින් නෙලා ගන්නා ලද දළු හැකි ඉක්මනින් කර්මාන්තශාලාව වෙත භාරදීම උසස් වර්ගයේ තේ නිෂ්පාදනය සඳහා ඉතාම වැදගත් ය.




තේ නිෂ්පාදනය විවිධාංගීකරණය කිරීමට ගත් උත්සාහයන් මල්ඵල ගන්වමින් මුල්ම වරට 1959 වසරේ දී තේ පර්යේෂණායතනයට ලංකා කාර්මික හා විද්‍යාත්මක පර්යේෂණ ආයතනය සමග එක්ව ජලයේ හොඳින් දියවෙන ක්ෂණික තේ හඳුන්වා දීමට හැකි විය. එම සොයා ගැනීම 1966 වසරේ දී වඩාත් විධිමත් අයුරින් ඉදිරිපත් කිරීමට තේ පර්යේෂණායතනයට හැකි විය.

1960 දශකයේ දී තේ පර්යේෂණායතනයේ පර්යේෂණ අරමුණු අතරට කඳ ගුල්ලා මර්දනය කිරීමට විධිමත් ක්‍රමයක් නිර්දේශ කිරීම මුල් තැනක් ගෙන තිබුණි. මේ අනුව එම දශකයේ මුල් කාලයේදී එම කෘමියා මර්දනයට ඩී.ඩී.ටී රසායනිකය නිර්දේශ කළ නමුත් 1979 වන විට එය භාවිතය සම්පූර්ණයෙන් ඉවත් කෙරිණි.

1970 වසරේ දී කඳ ගුල්ලා ගේ හානියට ප්‍රතිරෝධී තේ ප්‍රභේද රැසක් හඳුන්වා දීමට තේ පර්යේෂණායතනය සමත් වීම නිසා කඳගුල්ලා මර්දනයේ නව මාවතකට තේ වගාකරුවන් ගෙන යාමට තේ පර්යේෂණායතනයට හැකි විය.

කළු තේ නිපදවීමේ ක්‍රියාවලියේ ප්‍රබල සන්ධිස්ථානයක් ලෙස සැලකෙන තරල පත්‍ර වියළීමේ යන්ත්‍රය නොහොත් F.B.D. යන්ත්‍රය තේ කර්මාන්තශාලාවලට හඳුන්වා දීම 1974 වසරේ දී සිදු විය. දැනට ලංකාවේ මෙන්ම අනෙකුත් තේ නිපදවෙන රටවල භාවිත කරන මෙම යන්ත්‍රයේ පේටන්ට් අයිතිය තේ පර්යේෂණායතනය සතුය.

තේ වගාවන්ට අනවශ්‍ය ලෙස කෘෂි රසායන ද්‍රව්‍ය යොදා ගැනීමේ අහිතකර තත්ත්වය පිළිබඳ වඩාත් අවබෝධවීමත් සමග ම ශාක නිස්සාරක භාවිතයත් ජෛව විද්‍යාත්මක පාලන ක්‍රමත් ඇතුළත් ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම පිළිබඳ වැඩි උනන්දුවක් ඇති විය. එවැනි පර්යේෂණ කටයුතු සඳහා විද්‍යාඥයන් යොමුවීමක් 1990 දශකයේ මුල් භාගයේ සිට දක්නට ලැබුණි.

1960 දශකයේ දී තේ පර්යේෂණායතනයේ පර්යේෂණ අරමුණු අතරට කඳ ගුල්ලා මර්දනය කිරීමට විධිමත් ක්‍රමයක් නිර්දේශ කිරීම මුල් තැනක් ගෙන තිබුණි. මේ අනුව එම දශකයේ මුල් කාලයේදී එම කෘමියා මර්දනයට ඩී.ඩී.ටී රසායනිකය නිර්දේශ කළ නමුත් 1979 වන විට එය භාවිතය සම්පූර්ණයෙන් ඉවත් කෙරිණි.

පස සංරක්ෂණය කිරීම සඳහා නිර්දේශිත සමෝච්ච කාණු පද්ධති, ගල්වැටි ආදී ව්‍යුහයන් වෙනුවට පස සංරක්ෂණය මෙන්ම පසේ සශ්‍රීකත්වය වැඩි කරන ආවරණ වැටිලි, බෑවුම් ඉඩම් සඳහා දෙවැටි වගා (SALT) වැනි ජෛව සංරක්ෂණ ක්‍රම හඳුන්වාදීම 1990 දශකයේ මුල් වකවානුවේ දක්නට ලැබිණි.

නව තේ වගා ඉඩම්වල ආවරණ වැටිල්ලක් ලෙස ඇරචිස් පින්ටෝයි (Arachis pintoii) සහ දෙවැටි ක්‍රමය සඳහා ෆ්ලෙමින්ජියා කන්ජෙස්ටා (Flemingia Congesta) ඩෙස්මෝඩියම් රැන්සොනායි (Desmodium ransonaii) වැනි ශාක වර්ග නිර්දේශ කිරීම සිදුවිය. එමෙන්ම පසේ සශ්‍රීකභාවය ඉහළ නැංවීම සඳහා පාංශු ක්ෂුද්‍රජීවීන් ගේ ක්‍රියාකාරිත්වය ප්‍රශස්ත මට්ටමක ගෙන ඒමටත් ගැඩවිලි පණුවන් වැනි පාංශු ජීවීන් උපයෝගී කර ගැනීමේ පර්යේෂණ කටයුතු පිළිබඳත් මෙම කාලයේ දී වැඩි අවධානයක් යොමු විය.

තේ වගාකරන විවිධ ප්‍රදේශවල පාංශු, දේශගුණික හා රෝග පළිබෝධ තත්ත්වයන්ට හොඳින් ඔරොත්තු දෙන TRI 3000 සහ 4000 ශ්‍රේණිවල ප්‍රභේද රාශියක් වගාකරුවන් වෙත ලබාදීම 1990 දශකය පුරාවට සිදු විය. මෙම ප්‍රභේද අතරට සීටීසී තේ නිෂ්පාදනයට යෝග්‍ය ප්‍රභේද වර්ග 8 ක් ද ඇතුළත් වේ.

වියළි කාලයේ දී තේ වගාවන්ට සිදුවන හානි අවම කර ගැනීම සඳහා සුදුසු ජල සම්පාදන ක්‍රම වගා ක්‍රම සහ පොටෑසියම් සල්ෆේට් රසායනිකය භාවිත කිරීම පිළිබඳ නිර්දේශ රැසක් ඉදිරිපත් කිරීමට හැකිවීම 90 දශකයේ තේ නිෂ්පාදනය ඉහළ නැංවීමට සැලකිය යුතු අත්වැලක් සැපයී ය.

අපගේ තේ ආනයනය කරන ප්‍රධාන බටහිර රටවල්, තේවගාව සඳහා කෘෂි රසායන ද්‍රව්‍ය අඩුවෙන් භාවිත කිරීම පිළිබඳ මෙන්ම රසායන ද්‍රව්‍ය භාවිතයෙන් තොර "කාබනික තේ" පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන බවක් ;පත්නුම් කෙරිණි. නිර්දේශ කළ පළිබෝධ නාශක ද විෂ බවින් අඩු අවශේෂ තොරඳන රසායනික ද්‍රව්‍ය භාවිතය ද නිසා, 1997 පෙබරවාරි මස පවත්වනු ලැබූ ජාත්‍යන්තර ප්‍රමිති සම්මේලනයේදී ශ්‍රී ලංකාවේ තේ, රසායනික අවශේෂවලින් තොර ලෝකයේ පිරිසිදුම තේ ලෙස නම් කරනු ලැබීම මෑත භාගයේ අප ලබා ගත් සුවිශේෂ ජයග්‍රහණයක් ලෙස සනිටුහන් කිරීමට පුළුවන.

තේ ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තේ වගාව සමග රබර්, පොල්, කෘෂි අපනයන බෝග ආදිය වැවීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමත් භූගෝලීය තොරතුරු පද්ධති (GIS) තාක්ෂණය භාවිතයෙන් තේ ඉඩම්වල සැලසුම් සකස් කිරීමත් තොරතුරු ගබඩාකර තැබීමත් පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමටත් තේ පර්යේෂණායතනය කටයුතු කළේය.

දිනෙන් දින උග්‍ර වන පුහුණු කම්කරු හිඟයට පිළියමක් ලෙසත්, වගා කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහාත්, වගා කටයුතු යාන්ත්‍රීකරණය කිරීම පිළිබඳ තේ පර්යේෂණායතන විද්‍යාඥයින් අධ්‍යයන කටයුතුවල නිරත විය. එම උත්සාහයන් ගේ ප්‍රතිඵලයක් ලෙස නව සහසුකය ආරම්භයත් සමග ම තෝරා ගත් දලු පමණක් පහසුවෙන් නෙළිය හැකි සැහැල්ලු, සරල උපකරණයක් වගාකරුවන් වෙත ඉදිරිපත් කිරීමට හැකි විය. මෙම උපකරණයේ කාර්යක්ෂමතාවත්, උපයෝගීතාවේ සාර්ථකභාවයත් උදෙසා 2000

වසරේ ස්විට්සර්ලන්තයේ ජිනිවා හි පැවැත්වූ නව්‍ය කෘෂි උපකරණ ප්‍රදර්ශනයක දී රත් පදක්කමක් පුදනු ලැබීම තේ පර්යේෂණායතනය නව සහශ්‍රකය ආරම්භයේ දී ම ලත් සුවිශේෂ ජයග්‍රහණයකි.

තේ කර්මාන්තශාලාවල තේ දලු ඇඹරුම් සැලසුම් කළ හැකි පරිගණක වැඩ සටහනක් සහ තේ පොහොර භාවිතය විධිමත් කිරීම සඳහා පරිගණක වැඩසටහනක් පිළියෙල කර එම වැඩසටහන් පිළිබඳ වගාකරුවන් දැනුවත් කිරීම ද පසුගිය වකවානුවේ දී සිදුකරනු ලැබූ තවත් වැදගත් කටයුත්තකි.

මීතයිල් බ්‍රෝමයිඩ් නැමති රසායනිකයෙන් පරිසරයට, විශේෂයෙන් ඕසෝන ස්ථරයට සිදුවන හානි ගැන සැලකිල්ලට ගෙන ඒ සඳහා විකල්ප ක්‍රම වශයෙන් තවාන් පස ජීවානුහරණය කිරීම සඳහා මෙතම් සෝඩියම් රසායනය භාවිතය, පාංශු සූර්යතාපය සහ පාංශු ආදේශක භාවිතය නිර්දේශ කරනු ලැබීම පරිසරය සුරැකීම පිළිබඳ තේ පර්යේෂණායතනය දක්වන යහපත් ආකල්පයන් සඳහා හොඳම නිදසුන් ය.

තේ වගාවේ රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාවට පිළියමක් වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය යටතේ තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය සමග එක්ව හෙක්ටයාර් 83 ක මව් ශාක වගාවන් ස්ථාපනය කිරීම පසුගිය කාලය තුළ දියත් කළ ඉතාමත් වැදගත් ව්‍යාපෘතියක් ලෙස සඳහන් කළ හැකි ය.

දිනකට තේ පඳුරු 750 – 1000 ක් පමණ කප්පාදු කිරීමට හැකි, බල ශක්තියෙන් ක්‍රියාකරවන, අතේ ගෙන යා හැකි, කප්පාදු යන්ත්‍රයක් නිපදවා, ක්ෂේත්‍රයේ අත්හද බැලීමෙන් අනතුරුව අයිතිය සඳහා පේටන්ට් බලපත්‍රය ගැනීම සහ සරල සැහැල්ලු දලු කූඩයක් නිර්මාණය කර පේටන්ට් බලපත්‍රය ගැනීම ද තේ පර්යේෂණායතනය ලබාගත් ජයග්‍රහණ අතරට එක් වේ.

මෙම සැහැල්ලු දලු කූඩයට 2004 වසරේ ජිනිවා හි පැවැත්වූ නව්‍ය කෘෂි උපකරණ ප්‍රදර්ශනයක දී රත් පදක්කමක් ලැබීම තේ පර්යේෂණායතනය ලද තවත් ජයග්‍රහණයකි.

තේ පර්යේෂණායතනයෙන් වගා කරුවන් වෙත ඉටු කරනු ලබන මෙහෙවර තව තවත් විධිමත් කිරීම සඳහා තේ වගාවේ නිරත වන සියලු කණ්ඩායම්වල සහභාගිත්වයෙන් ඉදිරි වසර 5 සඳහා ආයතනික සැලැස්මක් (Corporate plan) පිළියෙල කර ඒ මත ඉදිරි පර්යේෂණ සැලසුම් ගොඩ නැගීමටත් ක්‍රියාත්මක කිරීමටත් තේ පර්යේෂණායතනය පියවර ගනු ලැබීය.

මෙම කාර්යයන් සියල්ලට ම උරදීම සඳහා, උපදෙස් හා ව්‍යාප්ති අංශය සමග, ශිෂ්‍ය විද්‍යා, ජීව රසායන, කීට විද්‍යා, ශාක අභිජනන, ශාක ව්‍යාධිවේද, පාංශු සහ ශාක පෝෂණ, තේ නිපදවීමේ තාක්ෂණ, ශාක කායික විද්‍යා සහ කෘෂි ආර්ථික විද්‍යා යන පර්යේෂණ අංශ, තලවකැලේ ප්‍රධාන විද්‍යාගාරයේ ද ප්‍රාදේශීය මධ්‍යස්ථාන 5 ක් ද තේ වගාකරන ප්‍රදේශ පුරා පිහිටුවා ඇත.

> දිනකට තේ පඳුරු 750 – 1000 ක් පමණ කප්පාදු කිරීමට හැකි, බල ශක්තියෙන් ක්‍රියාකරවන, අතේ ගෙන යා හැකි, කප්පාදු යන්ත්‍රයක් නිපදවා, ක්ෂේත්‍රයේ අත්හදා බැලීමෙන් අනතුරුව අයිතිය සඳහා පේටන්ට් බලපත්‍රය ගැනීම සහ සරල සැහැල්ලු දලු කූඩයක් නිර්මාණය කර පේටන්ට් බලපත්‍රය ගැනීම ද තේ පර්යේෂණායතනය ලබාගත් ජයග්‍රහණ අතරට එක් වේ.

## තලවකැලේ තේ පර්යේෂණ මධ්‍යස්ථානය

ප්‍රධාන පර්යේෂණාගාර සහ පරිපාලන අංශය තලවකැලේ ශාන්ත කූම්බ්ස් වතුයායේ පිහිටා ඇත. (මුහුදු මට්ටමේ සිට උස මීටර 1382) මෙය අයත් වන්නේ මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයටයි. (නුවරඑළියට කි.මී. 25 යි, තලවකැලේ කි.මී. 10 සහ කොළඹට කි.මී. 158)

දුරකතන අංක :- 051-2222601, 051-2223803-6

ෆැක්ස් :- 052-2258311, 052-2258299

විද්‍යුත් තැපැල :- Postmaste@tri.ac.lk

## පහත රට පර්යේෂණ උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, රත්නපුර

පහතරට මධ්‍යස්ථානය පිහිටා තිබෙන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ ශාන්ත රත්නපුර, ජෝකිම් වතුයායේ ය. (මුහුදු මට්ටමේ සිට උස මීටර් 29) පහතරට මධ්‍යස්ථානයේ සිට (රත්නපුරයට කි.මී. 10 යි, කොළඹට 100 යි)

දුරකතන අංක :- 045-2228928; 045-2228514; 045- 2228850-2

ෆැක්ස් :- 045-2228628

## මැදරට පර්යේෂණ, උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, මහනුවර

මැදරට මධ්‍යස්ථානය මධ්‍යම පළාතේ හන්තාන ප්‍රදේශයේ පිහිටා ඇත. (මුහුදු මට්ටමේ සිට උස මීටර 762) (මැදරට මධ්‍යස්ථානයේ සිට නුවරට කි.මී. 05, කොළඹට 122 යි)

දුරකතන අංක :- 081-2218832, 081-2218833, 081-2218509

ෆැක්ස් :- 081-2218833

උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, පස්සර

ඌව පළාතේ පසසර දිස්ත්‍රික්කයේ පස්සර පැලගහතැන්නේ පිහිටා ඇත. (මුහුදු මට්ටමේ සිට උස මීටර් 1120) (ඌව මධ්‍යස්ථානයේ සිට බදුල්ලට කි.මී. 15, කොළඹට කි.මී. 246)

දුරකතන අංක :- 055-2288246, 055-2288474

ෆැක්ස් :- 055-2288474

## උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, කොට්ටව, තල්ගම්පොල

දකුණු පළාතේ උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය ගාල්ල දිස්ත්‍රික්කයේ තල්ගම්පොල පිහිටා ඇත. (මුහුදු මට්ටමේ සිට උස මීටර 30 යි) කොට්ටව මධ්‍යස්ථානයේ සිට (ගාල්ලට කි.මී. 16 යි, කොළඹට කි.මී. 132 යි)

දුරකතන අංක :- 091-286096, 091-237669 ෆැක්ස් :- 091-286096

## උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය, ගැටඹරුව හන්දිය, කොටපොල, දෙනියාය

දෙනියාය උපදෙස් සහ ව්‍යාප්ති මධ්‍යස්ථානය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කොටපොල ගැටඹරුව හන්දියේ පිහිටා ඇත. (මෙම මධ්‍යස්ථානයේ දෙනියායට කි.මී. 10 යි, මාතරට කි.මී. 56 යි, ගාල්ල කි.මී. 80 යි. කොළඹට 150 යි)

දුරකතන අංක :- 041-2271496, 041-2271499 ෆැක්ස් :- 041-2271499

## පාංශු සහ පෝෂණ අංශයේ විශ්ලේෂණ විද්‍යාගාරය, වලහන්දූව

මෙම විද්‍යාගාරය ගාල්ල දිස්ත්‍රික්කයේ වලහන්දූව පිහිටා ඇත. (මුහුදු මට්ටමේ සිට උස මීටර 25) මෙම මධ්‍යස්ථානයේ සිට ගාල්ලට කි.මී. 12 යි. කොළඹට කි.මී. 120 දුරින් පිහිටා ඇත.

❑